ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2107/9 - 2019 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2019.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: 3/7/16/6.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/4/2015/එල්ඕ/183.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශී ලේකම් කොට්ඨාසයේ, යටිපළාත කෝරළේ 523 බී වැවතැන්න ග්‍රාම නිළධාරි වසමේ අඹන්ඇල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2018.11.28 දිනැති අවසාන ගම් පිඹුරු අංක 266 හි අතිරේක අංක 8, පත්‍ර අංක 8 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1099 ක් වන කැබලි අංක 561, 562 න් පෙන්වා දී ඇති ඉඩම්:

01. **කැබලි අංකය 561**
ඉඩමේ නම: වැවතැන්න; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; ප්‍රමාණය; හෙක්ටයාර් 0.0025.

02. **කැබලි අංකය 562**
ඉඩමේ නම: වැවතැන්න; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; ඉඩම් පරිහරණය: ගෙවත්ත, වතුර ටැංකියක් සහ ස්ථිර ගොඩනැගිලි දෙකක් ඇත; ප්‍රමාණය; හෙක්ටයාර් 0.1074.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 පෙබරවාරි මස 28 වැනි දින, පෙ.ව. 10.00 ට, වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 පෙබරවාරි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයි.එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2019 ජනවාරි මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-207



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*